රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 1/89

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

1989 ජනවාරි මස 05 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## පළාත් සභාවලට ඡන්දයෙන් පත් වූ රාජ්‍ය නිලධාරීන්.

1988 අගෝස්තු මස 24 දින සිට බලපවත්වන පරිදි ආයතන සංග්‍රහයේ XXXII පරිච්ඡේදය පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ. ආයතන සංග්‍රහයේ XXXII පරිච්ඡේදයේ 2:2:3,2:3:2, 2:3:4 සහ 3:7 උප වගන්ති ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන පරිදි ආදේශ කරන්න.

02. (I) "2:2:3 ජනාධිපති තේරීමකදී, පාර්ලිමේන්තු මැතිවරණයකදී, පළාත් සභා, දිස්ත්‍රික් සංවර්ධන සභා හා පළාත් පාලන මැතිවරණයකදී තරඟ කිරීම."

(II) "2:3:2 නිලධාරියකු, ජනාධිපති තේරීමකදී, පාර්ලිමේන්තු මැතිවරණයකදී, පළාත් සභා, දිස්ත්‍රික් සංවර්ධන සභා හෝ පළාත් පාලන මැතිවරණයකදී, අපේක්ෂකයකු වශයෙන් ඉදිරිපත් වීමට බලාපොරොත්තු වන්නේ නම්, ඔහු විසින් ඒ බව නාම යෝජනා පත්‍ර භාර ගන්නා දිනට යටත් පිරිසෙයින් දින 10 කට වත් කලින් දෙපාර්තමේන්තු ප්‍රධානියාට ලිඛිතව දැන්විය යුතුය. නාම යෝජනා පත්‍ර භාරගන්නා දිනට සතියකට පෙර සිට මැතිවරණ දිනය දක්වා වූ කාලසීමාව සඳහා ඔහුට පඩි රහිත නිවාඩු දිය යුතුය. එබඳු මැතිවරණයකට තරඟ කරන දේශපාලන අයිතිවාසිකම් හිමි රජයේ නිලධාරියෙකු නිවාඩු ඉල්ලුම් කරන වසරේදී, ඔහුට හිමි මෙතෙක් ලබා නොගත් සාමාන්‍ය නිවාඩු වේ නම්, ඒවා ලබා ගැනීමට ඔහුට පුළුවන."

(III) "2:3:4 ඔහු පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු හෝ වශයෙන් තෝරා ගනු ලැබුව හොත් රජයේ සේවයේ ඔහු දරමින් සිටි තනතුරින් ඉල්ලා අස්වන ලෙස ඔහුට නියම කරනු නොලැබේ. එහෙත් පළාත් සභාවේ, හෝ පළාත් පාලන ආයතනයේ හෝ රැස්වීම්වලට සහභාගි වීම සඳහා, සේවයේ හදිසි අවශ්‍යතාවයන්ට යටත්ව සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු ඔහුට දිය යුතුය. කෙසේ වෙතත් ඔහු පළාත් සභාවක මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා ගනු ලැබ, පසුව පළාතක ප්‍රධාන ඇමති, පළාත් ඇමති, පළාත් සභාවක සභාපති හෝ නියෝජ්‍ය සභාපති තනතුරකට තෝරා පත් කරගනු ලැබුවහොත් හෝ පත් කරනු ලැබුව හොත් එසේ එම තනතුරට තේරී පත්වූ හෝ පත්කළ දින සිට ඔහු රජයේ සේවයේ දරමින් සිටි තනතුරින් ඉල්ලා අස්වන ලෙස ඔහුට නියම කළයුතුය."

(iv) "3:7 දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීමට හිමිකම් ඇති නිලධාරියකු, පළාත් සභාවක මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වශයෙන් හෝ තේරී පත්වුවහොත්, රාජ්‍ය සේවයේ හදිසි අවශ්‍යතාවයන්ට හා විනයානුකූල නියමයන්ට යටත්ව, ඔහු නියෝජනය කරන පළාත් සභාවට හෝ පළාත් පාලන ආයතනයට ආසන්න කාර්ය ස්ථානයක සේවය කිරීමේ අනුග්‍රහය ඔහුට ලබාදිය යුතුය. ඔහු එක් පළාත් සභාවේ මන්ත්‍රී ධූරය හෝ පළාත් පාලන ආයතනයේ සභික ධූරය හෝ දරනතාක් කල් ඔහු සාමාන්‍ය මාරුකිරීම් වලට යටත් නොවේ."

සිරිල් ගමගේ
වැඩබලන ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.